# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

**අභියාචනා අංක:- AAT/35/2023 (PSC)**

කේ.ජී.ඔස්මන්

**අභියාචක**

**එදිරිව,**

පොලිස් කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය : 2025.09.16**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් රජයේ සේවක එච්.පී.ඒ.සුරන්ජිත් මහතා
වගඋත්තරකාර පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ, මාලා බස්නායක මහත්මිය.

**-<u>නියෝගය</u>-**

අභියාචක කේ.ජී.ඔස්මන් යන අය විසින් 2023.02.20 දින ඉදිරිපත් කරන ලද අභියාචනයෙන් ඉල්ලා ඇත්තේ, ඔහු වෙත නිකුත් කර ඇති විනය නියෝගය අවලංගු කර, ඔහුට හිමි හිඟ වැටුප් හා දීමනා ලබා දීමට නියෝග කරන ලෙසයි. අභියාචක වෙත නිකුත් කර ඇති විනය නියෝගය එවකට පොලිස්පති විසින් නිකුත් කර ඇති 2021.12.14 දිනැති ලිපියේ සඳහන්ව ඇත. එකී නියෝගය අනුව අභියාචක වෙත පහත සඳහන් දඬුවම නියම කර ඇත.

1. **තදින් තරවටු කිරීම.**
2. **වැඩ තහනමට ලක්ව සිටි 2009.11.12 දින සිට නැවත සේවයේ පිහිටවූ 2016.11.16 දක්වා කාලය වැටුප් රහිත සේවා කාලයක් සේ සැලකීම.**

අභියාචක වෙත නිකුත් කර ඇති දෙවන දඬුවම වශයෙන් සඳහන්ව ඇත්තේ, ඔහු සේවයේ නියුතුව නොසිටි කාලපරිච්ඡේදය, වැඩ රහිත

කාලයක් සේ සැලකිය යුතු බවටයි. එම කාලපරිච්ඡේදය තුළ අභියාචක රාජකාරියෙහි නියුතුව නොසිටි බව අවිවාදයෙන්ම පිළිගැනේ. එවැනි තත්ත්වයක් යටතේ, කිසියම් කාලපරිච්ඡේදයක් තුළ රජයට සේවයක් කළ නොමැති නිළධාරියකු සඳහා, එසේ සේවයේ නියුතුව නොසිටි කාලපරිච්ඡේදයට අදාළව වැටුප් ගෙවීමට නියම කළහොත්, එයින් රජයට මූල්‍යමය වශයෙන් පාඩුවක් සිදු වනවා ඇත. එම කරුණු සළකා බලා ඉහත සඳහන් දෙවන අයිතමය වශයෙන් සළකුණු කර ඇති දඬුවම ඉවත් කරන ලෙස කර ඇති ඉල්ලීම ප්‍රතික්ෂේප කරමු.

අභියාචකට විරුද්ධව නියම කර ඇති ඉතිරි දඬුවම වන්නේ **"තදින් තරවටු කිරීම"** යන දඬුවම පැනවීමයි. මෙම දඬුවම පැනවීම සඳහා පාදක කරගෙන ඇති කරුණු, ඉහත කී විනය නියෝගයේ V සහ VI යන ඡේදවල සඳහන් කර ඇත. එහි සඳහන් වන්නේ මූලික විමර්ශන ගොනුවේ සඳහන් කරුණු අනුව නිළධාරියා වරදක් සිදු කර ඇති බවට හැඟී යන බවයි. එවැනි ආකාරයේ හැඟීම් මත, කිසියම් පුද්ගලයකු වරදකරුවකු බවට පත් කිරීම නොකළ යුතුව තිබුණි. එවැනි හේතුවක් පුද්ගලයෙකු වරදකරු කිරීමට උපයෝගී කර ගත යුතු කරුණක් හැටියට සැළකිය නොහැක. ඊට අමතරව එම නියෝගයේ සඳහන්ව ඇත්තේ "බී" වාර්තාවකින් ඉදිරිපත් කරන ලද නඩුවකින් අභියාචක නිදහස් කර තිබෙන බවයි. නමුත් එය නිදොස් කොට නිදහස් කිරීමක් හැටියට සඳහන් නොවන නිසා, එම කරුණද සළකා බලමින් අභියාචක වෙත දඬුවම් පනවා ඇත. නමුත් ඉහත කී නියෝගය නිකුත් කර ඇත්තේ අභියාචක වෙත චෝදනා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව නොව, "බී" වාර්තාවකින් කරුණු ඉදිරිපත් කිරීමක් මත පමණි. එවැනි අවස්ථාවකදී නිදොස් කිරීමක් යන වචන යොදා නොගනී. තවද එයින් හැඟී යන්නේ අභියාචක වෙත පැහැදිළි චෝදනාවක් අධිකරණය ඉදිරියේ ඉදිරිපත් කර නොමැති බවයි. ඒ අනුව නිගමනය කළ හැකි වන්නේ අභියාචකට චෝදනා ඉදිරිපත් කිරීමට තරම් ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් නොවීමයි. එම නියෝගයේ වැඩි දුරටත් දක්වා ඇත්තේ, පරීක්ෂණ නිළධාරියාගේ වාර්තාවේ මෙම චෝදනා ඔප්පු කිරීමට නොහැකි වී ඇති බවටද සඳහන් කර ඇති බවයි.

ඉහත කී කරුණු සළකා බැලීමේදී පෙනී යන්නේ, අභියාචකගේ ඉදිරි උසස්වීම් යනාදිය අවහිර වන අන්දමට දඬුවමක් පවරා ඇති බවයි. ඒ

අනුව ඉහතින් සඳහන් කරුණු සළකා බලා අභියාචකට එරෙහිව **''තදින් තරවටු කිරීම''** යන වරදට වරදකරු කරමින් කර ඇති නියෝගය ඉවත් කිරීමට තීරණය කරමු. ඒ අනුව අවශ්‍ය පියවර ගැනීමට ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත දැනුම් දෙමු.

ඉහත කොන්දේසි වලට යටත්ව අභියාචකගේ ඉල්ලීමට අවසර දෙමු.

අභියාචක සේවයේ නොසිටි කාලයට අදාළ කිසිදු වැටුපක් හෝ දීමනාවක් ලබාගැනීමට අභියාචකට අයිතිවාසිකමක් හිමි නොවේ.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/-